# සංචාරක ප්‍රවර්ධනය සඳහා පුරාවිද්‍යාත්මක සහ සෞන්දර්යාත්මක වටිනාකම් සහිත ස්ථාන උපයෝගී කර ගැනීම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (තංගල්ල සහ බෙලිඅත්ත කලාප ඇසුරෙන්)

ඕ.අයි.ඩී. වීරනායක[1]

ප්‍රමුඛ පදඃ සංචාරක ප්‍රවර්ධනය, තංගල්ල සහ බෙලිඅත්ත, පුරාවිද්‍යාත්මක ස්ථාන, සෞන්දර්යාත්මක ස්ථාන

## හැඳින්වීම

සංචාරක ව්‍යාපාරය වර්තමානය වන විට ලෝකයේ ප්‍රධාන කර්මාන්තයක් බවට පත් වී ඇත. එහිදී අද මිනිසාගේ සමාජ, ආර්ථික, සංස්කෘතික මට්ටමේ අත්දැකීම් වර්ධනය සඳහා සංචාරක කර්මාන්තය මූලික මට්ටමේ ඉහළ වටිනාකමක් සහිත ක්ෂේත්‍රයක් ලෙස සංචාරක ව්‍යාපරය පෙන්වා දිය හැකිය. ශ්‍රී ලංකාවේ ජනප්‍රිය සංචාරක කලාපයක් ලෙස දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල සහ බෙලිඅත්ත කලාප පත් වී ඇත. එහි ඇති ස්වභා සෞන්දර්යාත්මක සහ පුරාවිද්‍යාත්මක ස්ථාන සංචාරක ආකර්ෂණය වැඩි කිරීමට හේතු වී තිබේ. මෙවන් විශේෂිත ගමනාන්ත බහුල ප්‍රදේශ වල සංචාරක කර්මාන්තය වර්ධනය වීම ප්‍රදේශයේ ආර්ථික සහ සමාජ සංවර්ධනයට හේතු වේ. මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටළුව වනුයේ තංගල්ල සහ බෙලිඅත්ත කලාපය ආශ්‍රිත ස්වභා සෞන්දර්යාත්මක හා පුරාවිද්‍යාත්මක ස්ථාන සංචාරක ප්‍රවර්ධනය සඳහා උපයෝගී කරගත හැකිද යන්නයි. එසේම අධ්‍යයනයේ අරමුණ වනුයේ තංගල්ල සහ බෙලිඅත්ත කලාපයේ සංචාරක ව්‍යාපාරය හඳුනා ගැනීම, එහි විභවතාවයන් හඳුනා ගැනීම සහ සංචාරක ව්‍යාපාරය සඳහා පුරාවිද්‍යාත්මක ස්ථාන සහ ස්වභා සෞන්දර්යාත්මක ස්ථාන උපයෝගී කර ගැනීම පිළිබඳව අධ්‍යනය කිරීමයි. එමෙන්ම තංගල්ල සහ බෙලිඅත්ත කලාප වල සංචාරක ප්‍රවර්ධනය සඳහා මෙකී ස්ථාන ඇතුළත් සිතියමක් සකස් කිරීම සහ මාර්ගයක් යෝජනා කිරීම මෙහි අනු අරමුණක් වේ.

[1] පුරාවිද්‍යා හා උරුම කළමණාකරණ අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
oiwdilshan@gmail.com

**ක්‍රමවේදය**

සංචාරක ප්‍රවර්ධනය සඳහා පුරාවිද්‍යාත්මක සහ ස්වභා සෞන්දර්යාත්මක ස්ථාන උපයෝගී කර ගැනීම පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක් තංගල්ල සහ බෙලිඅත්ත කලාප ඇසුරෙන් යන මාතෘකාව යටතේ මෙම පර්යේෂණ සිදු කිරීමේදී ප්‍රාථමික හා ද්විතීයක දත්ත රැස් කරනු ලැබේ. මේ සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනය, පුස්තකාල සහ අන්තර්ජාල තොරතුරු රැස්කිරීම වැනි ක්‍රමවේද භාවිත කරන ලදී. මෙම පර්යේෂණය සඳහා වන දත්ත විශ්ලේෂණ ක්‍රියාවලිය පිළිබඳව අර්ථවත් අවබෝධයක් ලබා ගැනීම සඳහා ගුණාත්මක හා ප්‍රමාණාත්මක විශ්ලේෂණ ක්‍රමවේදය භාවිත කරනු ලැබේ.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණක් වූයේ තංගල්ල සහ බෙලිඅත්ත කලාපවල සංචාරක විභවතාවයන් හඳුනා ගැනීමයි. එහි දී අධ්‍යයනයේ ප්‍රතිඵල අනුව පෙනී යන්නේ මෙම කලාප සංචාරක ආකර්ෂණය සඳහා හේතු වන පුරාවිද්‍යාත්මක සහ ස්වභා සෞන්දර්යාත්මක ස්ථාන රාශියකින් සමන්විත වන බවයි. මෙම ප්‍රදේශයෙහි වෙරළ තීරයන්හි සුන්දරත්වය සහ පැරණි විහාරාරාම හා නටබුන් සහිත ස්ථාන සංචරණයට ඉහළ වටිනාකමක් හිමි කර දෙයි. මීට අමතරව බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පොළොම්මාරුව වැව, දෙද්දුවාවල කඳුකර ප්‍රදේශය ද තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ රන්මුදු වැව වැනි ස්වභා සෞන්දර්යාත්මක ස්ථාන පිහිටා ඇත. බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පුවක්දණ්ඩාව පංච ථූපාරාමය, නිහිලුම ගල්කෙම පුරාණ රජමහා විහාරය, විලද්දර පුරාණ රජමහා විහාරය ද තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කහදව ශ්‍රී ධම්ම දින්න රජමහා විහාරය, රැකව රජමහා විහාරය, සිටිනාමළුව ආරණ්‍ය සේනාසනනය සහ වනාන්තරය, පලුතුඩුව ජයසුමනාරාම රජමහා විහාරය වැනි පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ක්ෂේත්‍ර රාශියක් පිහිටා ඇත.

එබැවින් මෙම කලාපය සංචාරක කර්මාන්තය ඔස්සේ සමාජ, ආර්ථික සහ සංස්කෘතික දියුණුව අත්දැකීම් වර්ධනය කිරීමට ඉහළ විභවයක් ඇති ප්‍රදේශ ලෙස තහවුරු විය. මෙම අධ්‍යයන කලාපය තුළ සංචාරක ප්‍රවර්ධනය සඳහා ඉහළ හැකියාවක් ඇති බව පැහැදිලිව හඳුනා ගත හැකිය.

එබැවින් තංගල්ල සහ බෙලිඅත්ත කලාපය ආශ්‍රිත සෞන්දර්යාත්මක ස්ථාන හා පුරාවිද්‍යාත්මක ස්ථාන සංචාරක ප්‍රවර්ධනය සඳහා උපයෝගී කරගත හැකි ය. මෙම ස්ථාන සංචාරකයන්ගේ ආකර්ෂණය වැඩි කිරීමේ එක ලෙස ඉතා වැදගත් වේ. ස්වභාවික ස්ථාන මඟින් විවේකී සහ පාරිසරික සුන්දරත්වය අත්විදිය හැක. පුරාවිද්‍යාත්මක ස්ථාන මඟින් ඓතිහාසික දැනුම සහ සංස්කෘතික දැනුමක් ලබා දෙයි. කෙසේ වෙතත්, මෙම ස්ථාන වෙන වෙනම සංචාරක ගමනාන්ත ලෙස ඒකාබද්ධ කර සම්පූර්ණ සංචාරක මාර්ගයක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවක් පවතී. මෙහි දී නිසි අයුරින් ප්‍රවර්ධනය කිරීමෙන් සංචාරක

කර්මාන්තයේ ප්‍රවර්ධනය කොට සහ සමාජයට තිරසාර සංවර්ධනයක් මාවතක් හෙළිකරගත හැකි වනු ඇත.

තංගල්ල සහ බෙලිඅත්ත කලාපවල සංචාරක ප්‍රවර්ධනය සඳහා පුරාවිද්‍යාත්මක ස්ථාන සහ ස්වභාවික ස්ථාන ඇතුළත් සිතියමක් සකස් කිරීම සහ මාර්ග සැලසුමක් යෝජනා කිරීම පර්යේෂණයේ උප අරමුණ වේ. ඒ අනුව මෙම කලාපයේ ඇති ප්‍රධාන ආකර්ෂණීය ස්ථාන හඳුනාගෙන ඒවා ඒකාබද්ධ සැලසුමක් නමින් නව සංචාරක මාර්ග යෝජනා කරන ලදි. මෙම මාර්ගය නිර්මාණය කිරීමේදී, සංචාරකයන්ට දින කිහිපයක් තුළ මෙම ස්ථාන සියල්ල ආවරණය කිරීමට හැකිවන පරිදි නිර්මාණය කරයි. මෙමගින් සංචාරකයන්ට සිය ගමනාන්තයන් පහසුවෙන් සැලසුම් කර ගැනීමටත්, එමගින් ප්‍රදේශයේ ආර්ථිකයට දායකත්වයක් ලබා දීමටත් අවස්ථාවක් හිමි වේ. මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමෙන් කලාපයේ සංචාරක කර්මාන්තය ඉහළ නැංවීමට මනා පිටිවහලක් ලැබෙනු ඇත.

## නිගමනය

මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල අනුව තංගල්ල සහ බෙලිඅත්ත කලාපයන් සංචාරක ප්‍රවර්ධනය සඳහා ඉතා ඉහළ විභවයක් සහිත ප්‍රදේශ ලෙෂ තහවුරු වේ. යෝජිත කලාපයේ වැව් සහ කඳුකර ප්‍රදේශ වැනි ස්වභා සෞන්දර්යාත්මක ස්ථානයන්ගෙන් මෙන්ම විහාරස්ථාන හා පුරාණ නටබුන් වැනි ඓතිහාසික හා සංස්කෘතික ස්ථාන රැසකින් සමන්විත වේ. මෙම ස්ථාන වෙන වෙනම නොව 'සංස්කෘතික හා ස්වභාවික උරුම මාර්ගය' ලෙස ඒකාබද්ධව සිතියම්ගත කොට ප්‍රවර්ධනය කිරීමෙන්, නරඹන්නන්ට දින කිහිපයක් තුළ ආකර්ෂණීය අත්දැකීම් සමූහයක් ලබා ගත හැකිය. එමගින් මෙම ප්‍රදේශවල සමාජ-ආර්ථික දියුණුවට තිරසාර දායකත්වයක් ලබා දීමටත් හැකි බව නිගමනය කළ හැකිය.

## ආශ්‍රිත මූලාශ්‍රය


පතිරණ, යූ.පී.එස්. (2001). ***සංචාරක ව්‍යාපාරය පරිසරය සමාජය ආර්ථිකය.*** සරස්වතී ප්‍රකාශන.

පතිරණ, යූ.පී.එස්. (2001). ***ලංකාවේ සංචාරක ව්‍යාපරය.*** වරකපොළ: ආරිය ප්‍රකාශකයෝ.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව. (2019). ***පුරාවිද්‍යා ස්ථාන නාමාවලිය.*** හම්බන්තොට දිස්ත්‍රික්කය පළමු වෙළුම.

රත්නපාල, ඊ.ඇම්.(2000). ***සංචාරක ව්‍යාපාරය හා ශ්‍රී ලංකාව.*** දිවුලපිටිය: සරස්වතී ප්‍රකාශන.